# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත

---

**[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 දෙසැම්බර් මස 20 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 33.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 11.25 යි.**

**2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත**

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 44/2002

**සංයුක්ත ජාතික ප්‍රතිපත්තියක් ප්‍රකාර ඇතැම් මහජන උපයෝගිතා කර්මාන්ත නියාමනය සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

I වන කොටස

**ප්‍රාරම්භක විධිවිධාන**

කෙටි නාමය, ක්‍රියාත්මක වීමේ දිනය සහ අදාළ වීම.

1. (1) මේ පනත 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. මේ පනතේ වෙන් වෙන් විධිවිධාන සඳහා වෙන් වෙන් දින නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත, මේ පනතේ උපලේඛනයේ ගෙනහැර දැක්වෙන සහ විධිමත් කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පැවරී තිබෙන හෝ පැවරී තිබෙන මහජන උපයෝගිතා කර්මාන්තවලට අදාළ විය යුතු ය.

(3) පනතේ උපලේඛනයට යම් උපයෝගිතා කර්මාන්තයක් එකතු කිරීම හෝ එයින් යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් ඉවත් කිරීම මහජන යහපත පිණිස අවශ්‍ය යයි හෝ අවස්ථාෝචිත යයි සැලකෙන අවස්ථාවක දී පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් එසේ ඊට යම් උපයෝගිතා කර්මාන්තයක් එකතු කිරීමෙන් හෝ යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් එයින් ඉවත් කිරීමෙන් හෝ එම උපලේඛනය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පිහිටුවීම.

**2.** (1) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යනුවෙන් හැඳින්වෙන (මෙහි මින් මතු " කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයෝ.

**3.** (1) 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව, අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකගත්වය ඇතිව පත් කරනු ලබන සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

ඔවුන් අතුරෙන් –

(අ) යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු ඉංජිනේරු ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් හා පළපුරුද්දක් සහිත තැනැත්තකු විය යුතු ය ;

(ආ) යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු නීති ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් හා පළපුරුද්දක් සහිත තැනැත්තකු විය යුතු ය ; සහ

(ඇ) යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් හා පළපුරුද්දක් සහිත තැනැත්තකු විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ප්‍රථම සාමාජිකයන්, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස හතරක් ඇතුළත පත් කරනු ලැබිය යුතු අතර ඉන් පසුව ඇතිවන කොමිෂන් සභාවේ සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක්, ඒ පුරප්පාඩුව ඇති වී මාස තුනක් ඇතුළත පුරවනු ලැබිය යුතු ය.

4. (1) යම් තැනැත්තකු, මේ පනත යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කිරීම පිළිබඳව සිය එකඟත්වය දීමට ප්‍රථම, ඒ තැනැත්තා එසේ පත්කිරීම සඳහා 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තකු බවට සහ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත්කරනු ලැබීමට නුසුදුසුකමකට පාත්‍ර වූ තැනැත්තකු නොවන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සෑහීමට පත් විය යුතු ය.

මේ පනත යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්ය.

(2) යම් තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය දීමේ තීරණ එම සභාවේ බහුතර ඡන්දයෙන් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අවශ්‍ය විය හැකි තොරතුරු සපයන ලෙස, 3 වන වගන්තිය යටතේ සාමාජිකයකු ලෙස පත්කිරීම සඳහා සැලකිල්ලට භාජන වී සිටින යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ පුරප්පාඩුවක් ඇති වූ දින සිට එක් මාසයක් ඇතුළත, අමාත්‍යවරයා විසින්, කොමසාරිස්වරයකු ලෙස පත්කිරීම සඳහා නියමිත තැනැත්තන්ගේ නම්, මනාප අනුපිළිවෙල අනුව, ව්‍යවස්ථා සභාවේ එකඟත්වය සඳහා, යැවිය යුතු ය. යම් තැනැත්තකු, කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබීමට නියමිත තැනැත්තන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එකඟවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එම පත්කිරීම් කළයුතුව තිබෙන දිනයට යටත් පිරිසෙයින් එක් මාසයකට කලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එහි එකඟත්වය අමාත්‍යවරයා වෙත ප්‍රකාශ කළ යුතු ය.

5. (1) කොමිෂන් සභාවේ සාමාජිකයන්, ඉංජිනේරු විද්‍යාවට, නීතියට, ආර්ථික විද්‍යාවට, ව්‍යාපාර කළමනාකරණයට, ගණකාධිකරණයට හෝ පරිපාලනයට සම්බන්ධ ගැටලු පිළිබඳව යොමු වීමේ හැකියාව පෙන්නුම් කර තිබෙන දක්ෂතාවයෙන් හා අවංකභාවයෙන් යුත් තැනැත්තන් විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සුදුසුකම් යනාදිය.

(2) (අ) ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් ; හෝ

(ආ) ඔහු හෝ ඇය සාපරාධි වරදකට වරදකරු වී ඇත්නම් ; හෝ

(ඈ) ඔහු හෝ ඇය නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්වූවකු නම් හෝ ඔහුගේ හෝ ඇයගේ ණයහිමියන් සමග යම් වැඩපිළිවෙළක් යොදගත්තකු නම් ; හෝ

(ඇ) ඔහු හෝ ඇය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ පත්කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ නාමයෝජනයට පූර්ව අවුරුදු තුන ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිට ඇත්නම් ; හෝ

(ඉ) ඔහු හෝ ඇය පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු වේ නම් ; හෝ

(ඊ) ඔහු හෝ ඇය පාර්ලිමේන්තු මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක යම් තනතුරක් දරන්නේ නම් ; හෝ

(උ) ඔහු හෝ ඇය හෝ ඔහුට හෝ ඇයට සම්බන්ධකමක් ඇති තැනැත්තෙක් හෝ යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් කරගෙන යන සමාගමක හෝ ව්‍යාපාරයක, ස්වකීය සම්බන්ධතාවල සට්ටනයක් සෘජුවම හෝ වක්‍රව ඇති විය හැකි ආකාරයේ මූල්‍යමය හෝ අන්‍යාකාර සම්බන්ධතාවක් දරන්නේ නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට සුදුස්සෙක් නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ ධුරකාලය.

**6.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබූ දිනයෙදී බලාත්මක විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා 7 වන වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙන් පසුව, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයක් විසින් සම්මත කරන ලද යෝජනාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ධුරකාලය, පත්කරනු ලැබූ දින සිට අවුරුදු පහක් විය යුතු ය :

එසේ වුවද, කොමිෂන් සභාවේ ප්‍රථම සාමාජිකයන් අතරින් සභාපති ලෙස පත් කරනු ලැබූ සාමාජිකයා හැර අනෙකුත් සාමාජිකයන්, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පිළිවෙලින් අවුරුදු හතරක, තුනක, දෙකක හා එක් අවුරුද්දක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා, කොමිෂන් සභාවේ සාමාජික ධුරයක් හිස් වූ අවස්ථාවක ඔහු හෝ ඇය වෙනුවෙන් 5 වන හා 7 වන වගන්තිවල විධිවිධාන පිළිබඳව සැලකිලිමත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව වෙනත් සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත්කරනු ලැබූ සාමාජිකයා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුරකාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(5) ඉවත් කිරීමෙන් හැර අන් හේතුවක් නිසා ධුරකාලය අවසන්වීමට නියමිත කොමිෂන් සභාවේ සාමාජිකයකු (අනුක්‍රමික හෝ අන්‍යාකාරව) වැඩිදුර එක් ධුරකාලයකට නොවැඩිව නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු අතර එම පාරිශ්‍රමික කොමිෂන් සභාවේ අරමුදලට වැයබරක් විය යුතු ය. කොමිෂන් සභාවේ සාමාජිකයන් ඒ ඒ සාමජිකයා වෙත නිකුත් කරනු ලබන පත්කිරීමේ ලිපියේ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව අර්ධකාලීන පදනමක් මත කොමිෂන් සභාවේ බලතල ක්‍රියාවේ යෙදීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තෙක් කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වීමෙන් පසු අවුරුදු තුනක කාලයක් ඉකුත් වනතෙක් ඔහු හෝ ඇය කොමිෂන් සභාවේ බලතල ක්‍රියාවේ යෙදීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී දැනගන්නට ලැබුණු තොරතුරු ප්‍රයෝජනයට ගැනීමට හෝ හෙළිදරව් කිරීමට සිදුවිය හැකි, ශ්‍රී ලංකාවේ යම් ධුරයක්, සේවා නියුක්තියක්, උපදේශකත්වයක්, වැඩපිළිවෙලක් හෝ ව්‍යාපාරයක්, කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ අත්කර ගැනීම, දැරීම හෝ කරගෙන යාම නොකළ යුතු

අතර එවැනි යම් සම්බන්ධයක් අතිවිෂාතුගතව හෝ අනුප්‍රාප්තියෙන් හෝ තෙස්තමේන්තු නියාදනයකින් හෝ අත් වූ අවස්ථාවක, ඒ සම්බන්ධය අත් වී මාස දෙකක් ඇතුළත එය අවසන් කළ යුතු ය.

සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීමේ කාර්ය පරිපාටිය.

7. අමාත්‍යවරයා විසින් –

(අ) මෙහි පහත දැක්වෙන හේතු එකක් හෝ වැඩි ගණනක් මත ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කිරීමට අදහස් කරන බවට එනම් ඔහු හෝ ඇය, –

(i) නිදහස් නොකළ වස්තු භංගත්වයට පත්වූවකු නම් හෝ ඔහුගේ හෝ ඇයගේ ණයහිමියන් සමග වැඩපිළිවෙලක් යොදාගත්තකු වීම හෝ ;

(ii) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබූ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබූ තැනැත්තකු වීම ; හෝ

(iii) සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට සුදුස්සකුව සිටීම නතර වී තිබීම හෝ සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වී තිබීම ; හෝ

(iv) මාස තුනක හෝ ඊට වැඩි කාලසීමාවක් තුළ ඔහුගේ හෝ ඇයගේ කර්තව්‍ය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර හෝ පැහැර හැර තිබීම ; හෝ

(v) අවකල්ක්‍රියාව සම්බන්ධයෙන් වරදකරු වී තිබීම,

යන හේතු අතුරෙන් එකක් හෝ වැඩි ගණනක් මත ධුරයෙන් ඉවත් කිරීමට අදහස් කරන බවට එම යෝජිත ඉවත් කිරීමේ හේතු පිළිබඳ සම්පූර්ණ විස්තර ද සමග දැන්වීමක් අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙත යවා ඇත්නම් සහ යෝජිත ඉවත් කිරීමට එරෙහිව කරුණු කියා සිටීමට ඒ සාමාජිකයාට අවස්ථාවක් දී ඇත්නම් මිස ද ;

(ආ) අමාත්‍යවරයා සාමාජිකයා වෙත යැවූ දැන්වීමේ නිශ්චිතව දැක්වුණු හේතු මත සාමාජිකයා ඉවත් කිරීම යුක්ති සහගත බව සාමාජිකයා විසින් කියා සිටින ලද කරුණු ඇතොත් ඒවා සැලකිල්ලට ගැනීමෙන් පසුව, අමාත්‍යවරයා

විසින් වාර්තා කර ඇත්නම් සහ ඒ වාර්තාව සමග සාමාජිකයා ඉදිරිපත් කළ කරුණු සැලකිරීමට ද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත්නම් මිස ;

(ඇ) අමාත්‍යවරයාගේ වාර්තාව සහ සාමාජිකයාගේ කරුණු සැලකිරීම් සලකා බැලීමෙන් පසුව, පාර්ලිමේන්තුව විසින් ඒ සාමාජිකයා ඉවත් කිරීමේ යෝජනාවක්, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවේ බහුතර ඡන්දයෙන් සම්මත කර ඇත්නම් මිස ද කොමිෂන් සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් නොකළ යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා.

**8.** (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු (මෙහි මින් මතු "සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින්, තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එය අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබූ දිනයේ සිට එය බලාත්මක විය යුතු ය.

(3) සභාපතිවරයා 6 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, ඔහු හෝ ඇය සභාපති ධුරය දැරීම අවසන් විය යුතු ය.

(4) සභාපතිවරයාගේ ධුරකාලය අවුරුදු පහක් විය යුතු ය.

(5) සභාපතිවරයා සභාපති ධුරය ඇත්හැරීමෙන් පසුව සභාපති ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු නොවිය යුතු ය.

(6) 7 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොවන පරිදි, රෝගාතුරවීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තමා ධුරයෙන් ඉවත්ව සිටින කාලසීමාව තුළ සභාපති ධුරයේ කර්තව්‍ය ඉටුකිරීම පිණිස නියෝජ්‍ය සභාපතිවරයකු සභාපතිවරයා විසින් ඔහුගේ හෝ ඇයගේ පත්වීමේ දින සිට මාසයක් ඇතුළත සාමාජිකයන් අතුරෙන් ලියවිල්ලක් මගින් නම් කළ යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම.

**9.** (1) සභාපතිවරයා, කොමිෂන් සභාවේ සියලු රැස්වීම් කැඳවිය යුතු ය. කොමිෂන් සභාවේ කවර හෝ සාමාජිකයකු විසින්, කොමිෂන් සභාවේ රැස්වීමක් කැඳවන ලෙස, ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටිය හැකි අතර, සුදුසු හේතු ඇත්නම් මිස, එසේ රැස්වීමක් කැඳවීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) හදිසි කාරණයක් බවට සභාපතිවරයා තීරණය කරන යම් කාරණයක්, සාමාජිකයන්ගේ බහුතරයේ එකඟත්වයෙන් තීරණය කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් නියෝජ්‍ය සභාපතිවරයා ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ රැස්වීමක ගණපූරණය, සභාපතිවරයා ඇතුළුව සාමාජිකයන් තිදෙනකු විය යුතු ය. සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී ගණපූරණය නියෝජ්‍ය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(5) කොමිෂන් සභාවේ තීරණය සඳහා වන සියලු කාරණා කොමිෂන් සභාවේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් අනුමතය ලබන යම් කාරණයක් පිළිබඳ තීරණය, කොමිෂන් සභාවේ තීරණය ලෙස සැලකිය යුතු ය.

(6) හේතු දක්වා අනුමත කරන කොමිෂන් සභාවේ සියලු තීරණ, ලියවිල්ලකින් විය යුතු අතර, 10 වන වගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව එහි කොමිෂන් සභාවේ මුද්‍රාව තැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු යම් කාරණයකට පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවල දී සභාපතිවරයාට තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(8) මේ වගන්තියේ මීට පූර්වයෙන් ඇති විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් සිය කාර්ය පටිපාටිය විධිමත් කරගත හැකි ය.

(9) කොමිෂන් සභාවේ සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමෙහිලා දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක්, කොමිෂන් සභාවේ කිසි ක්‍රියාවක්, තීරණයක් හෝ නිතිකෘත්‍යයක් නිර්බල ලෙස නොසැලකිය යුතු ය.

10. කොමිෂන් සභාවේ මුද්‍රාව - කොමිෂන් සභාවේ මුද්‍රාව.

(අ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය ;

(ආ) කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි තැනැත්තකු භාරයේ තිබිය යුතු ය ;

(ඇ) කොමිෂන් සභාවේ අනුදැනුම ඇතිව සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් ද එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

## III වන කොටස

### අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනිකුත් කාර්ය මණ්ඩලය පත්කිරීම.

11. (1) කොමිෂන් සභාව විසින්, එහි ප්‍රථම සාමාජිකයන් පත් කරනු ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත සහ ඉන් පසුව පුරප්පාඩුවක් ඇතිවන කවර හෝ අවස්ථාවක, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඔහු කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමිකය ඇතුළු සේවා කොන්දේසි කොමිෂන් සභාව විසින් නිශ්චය කළ යුතු ය. කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු.

(2) නිශ්චිත කර්මාන්තයක් පිළිබඳ වගකීම දැරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයන් එක්කෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයන් පත් කිරීම හා සම්බන්ධයෙන්, 5 වන වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල සහ 6 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාවේ යෙදීම, එහි කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පරිපාලනය හා පාලනය කිරීම සඳහා අවශ්‍ය කොමිෂන් සභාවේ එදිනෙද කටයුතු, පවත්වාගෙන යාම කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර වන්නේ ය.

(5) කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට අදාළ පරිපාලන හා පාලන බලතල හැර, එහි කාර්ය මණ්ඩලය පරිපාලනය කිරීම හා පාලනය කිරීමට අදාළ තීරණ ගැනීමේ කොමිෂන් සභාවේ බලතල පමණක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගි විය යුතු ය. එසේ වුවද, ඔහු හෝ ඇය හා සම්බන්ධ යම් කාරණයක් හෝ ඔහු හෝ ඇය වෙනුවට අනුප්‍රාප්තිකයකු පත්කිරීම හා සම්බන්ධ යම් කාරණයක් හෝ සාකච්ඡා වන රැස්වීමකට අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි නොවිය යුතු ය. ඔහුට රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකමක් නොමැති විය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වලංගු ආකාරයෙන් පවරා දී තිබෙන බලතල අතුරින්, ඔහු හෝ ඇය වෙත මේ වගන්තියෙන් පවරා තිබෙන බලතල පැවරීමේ බලය හැර කවර හෝ බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් කොමසාරිස් ජනරාල්වරයා විසින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු වෙත හෝ කොමිෂන් සභාවේ යම් කාර්ය මණ්ඩලයක් වෙත, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව පවරා දෙනු ලැබිය හැකි අතර ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කාර්ය මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිශ්චිත හෝ සාමාන්‍ය විධානවලට අනුකූලව ඒ බලතල ක්‍රියාවේ යෙදීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත පරිදි (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු හෝ ධුරයෙන් ඉවත් කළ හැකි ය.

12. (1) කොමිෂන් සභාව විසින්- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

(අ) වෙනත් දේ අතර, සංස්ථා ලේකම්, සමාගම් ලේකම්වරයකු හා සමානව කාර්යභාරය කරගැනීම සඳහා ලේකම්වරයකු පත් කළ යුතු ය ;

(ආ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන අනිකුත් කාර්ය මණ්ඩලය පත් කළ හැකි ය ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය කිරීම කළ හැකි ය ;

(ඈ) ඒ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවිය යුතු අනුප්‍රමාණ නියම කළ යුතු ය ;

(ඉ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි හා නියමයන් නිශ්චය කළ යුතු ය ; සහ

(ඊ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය පිණිස අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කර ගැනීම සහ කොමිෂන් සභාවේ අරමුදලින් ඒ යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල්වරයකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

13. (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු එහි ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටී නම්) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවේ අනිකුත් සාමාජිකයන් විසින් ස්වකීය ධුරයේ නිල රහස්‍යභාවය.

කාර්යය භාරගැනීමට ප්‍රථම අමාත්‍යවරයා නියම කරන ආකෘතියක සහ එසේ නියම කරන ආකාරයකට හා යම් බලධරයකු ඉදිරියේ, රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය. කොමිෂන් සභාවේ සියලු නියෝජිතයන්,. උපදෙස් දෙන්නන් සහ උපදේශකයන් රහස්‍යභාවය පිළිබඳ එම නියමයන් පිළිපැදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

## IV වන කොටස

### අරමුණු. බලතල හා කර්තව්‍ය

කොමිෂන් සභාවේ අරමුණු.

14. (1) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සහ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ එහි බලතල ක්‍රියාවේ යෙදීම, කර්තව්‍ය ඉටු කිරීම සහ කාර්ය කිරීම, සාධාරණව, අපක්ෂපාතිව හා ස්වාධීනව සහ කාලීන වූ ද විනිවිද පෙනෙන්නා වූ ද අරමුණු මූල්කර ගෙන හා මේ පනතට සහ එකී වෙනත් පනතට අනුකූලව යුක්තිසහගතව කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් සිදු නොවී, කොමිෂන් සභාව විසින්, මේ පනතින් හෝ වෙනත් යම් කර්මාන්ත පනතකින් හෝ ඒ පනතක් යටතේ හෝ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ නියම වී ඇති බලතල ක්‍රියාවේ යෙදීම, කර්තව්‍ය ඉටු කිරීම සහ කාර්ය කිරීම-

(අ) සියලු පාරිභෝගිකයන්ගේ අයිතිය ආරක්ෂා කිරීම;

(ආ) තරඟකාරිත්වය ප්‍රවර්ධනය ;

(ඇ) මහජන උපයෝගිතා කර්මාන්තවල ක්‍රියාකාරිත්වය සහ ප්‍රාග්ධන ආයෝජනය යන දෙකෙහිම කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය :

(ඈ) මහජන උපයෝගිතා කර්මාන්තවලට සම්පත් කාර්යක්ෂමව වෙන්කර දීම ප්‍රවර්ධනය ;

(ඉ) මහජන උපයෝගිතා කර්මාන්තවල ආරක්ෂාකාරිත්වය සහ සේවාවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය ;

(ඊ) හැකි අවස්ථාවල දී, ජාත්‍යන්තර ප්‍රමිතිවලට ප්‍රතිපාර්ශ්වික උපයෝගිතා සේවා "බෙන්ච්මාර්ක්" කිරීම ; සහ

(උ) කාර්යක්ෂමව ක්‍රියා කරන මිල පාලිත අස්ථිත්වවලට ඔවුන්ගේ මහජන උපයෝගිතා කර්මාන්ත සඳහා මුදල් සපයා ගැනීමෙහි ලා අයථා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු නොවන බවට වග බලාගැනීම,

අරභයා වඩාත්ම යෝග්‍ය බවට කොමිෂන් සභාව සලකන ආකාරයකින් සිදු කළ යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමට කොමිෂන් සභාව සතු බලය.

**15.** (1) කොමිෂන් සභාවට එහි කර්තව්‍ය කරගෙන යාම සඳහා සාධාරණව අවශ්‍ය පරිදි පහත සඳහන් බලතල, එනම් :–

(අ) කොමිෂන් සභාවට අවශ්‍ය වන්නා වූ සහ නියාමනය කළ අස්ථිත්වයක් ද ඇතුළුව යම් තැනැත්තකුගේ භාරයේ හෝ පාලනය යටතේ තිබෙන යම් තොරතුරු, පොත්පත්, ගිණුම් හෝ වෙනත් ලේඛන, කොමිෂන් සභාව වෙත කිසියම් කාලයකට වරක් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය වූ විටක හෝ සපයන ලෙස, ඒ අස්ථිත්වය ද ඇතුළු යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටීමේ බලය ;

(ආ) කොමිෂන් සභාව හමුවේ තිබෙන යම් කාරණයක් පිළිබඳව සාක්ෂි දීමට කොමිෂන් සභාවේ මතය අනුව හැකියාව තිබෙන යම් තැනැත්තකුට, පනතේ 18 වන වගන්තිය යටතේ පැවැත්වෙන ප්‍රසිද්ධ විභාගයකට පැමිණෙන ලෙස කැඳවීමේ බලය,

ඇත්තේ ය.

(2) තොරතුරු සපයන ලෙස මේ වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ තිබෙන යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත එම තොරතුරු, පොත්පත්, ගිණුම් හෝ වෙනත් ලේඛන සැපයිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් තමාගෙන් ඉල්ලා සිටින ලද තොරතුරු, පොත්පත්, ගිණුම් හෝ වෙනත් ලේඛන සැපයීම, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර

හරින කවර හෝ තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට යටත් වන අතර, එම වරද අඛණ්ඩ වරදක් වන අවස්ථාවක, එම පැහැර හැරීම කරගෙන යන එක් එක් දවස සඳහා වැඩිදුර රුපියල් පණස් දහස බැගින් වූ දඩයකට යටත් වන්නේ ය :

එසේ වුවද, මේ වගන්තියේ සඳහන් තැනැත්තකුට සිවිල් නඩුකටයුත්තක දී ඉදිරිපත් කිරීමට බලකල නොහැකි ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් නඩු කටයුත්තක සාක්ෂියක දී සපයන ලෙස බලකළ නොහැකි තොරතුරු සපයන ලෙස හෝ ඒ තැනැත්තකුට බල නොකළ යුතු ය.

(4) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් නිශ්චිත ව්‍යාපාරයක් පිළිබඳ තොරතුරු කිසිවක්-

(අ) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ හෝ ප්‍රකාර ලබාගෙන ඇති ;

(ආ) යම් පුද්ගලයකුගේ කටයුතු හෝ යම් නිශ්චිත ව්‍යාපාරයක් හෝ පිළිබඳව වන ; සහ

(ඇ) එම තොරතුරු සපයන අවස්ථාවේ දී රහස්‍ය හෝ වාණිජමය වශයෙන් සංවේදී බව ලියවිල්ලක් මගින් ප්‍රකාශිත,

අවස්ථාවක, ඒ පුද්ගලයාගේ ජීවිත කාලය තුළ හෝ ඒ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන තාක් කල්, ඒ පුද්ගලයාගේ හෝ ව්‍යාපාරයේ ලිඛිත එකහත්වය නොමැතිව, කොමිෂන් සභාව විසින් හෙළිදරව් නොකළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන-

(අ) අධිකරණයකට අවශ්‍ය තොරතුරු හෙළිදරව් කිරීමකට ; හෝ

(ආ) එම තොරතුරු හෙළිදරව් කිරීම මහජන යහපත පිණිස අවශ්‍ය බව කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවකට ; හෝ

(ඈ) ඒ තොරතුරු වෙනත් තැනැත්තකුට හෙළිදරව් කිරීම, බලපත්‍රයක කොන්දේසි ප්‍රකාර හෝ යටතේ හෝ නියමිතව ඇති විටක, ඒ කොන්දේසිය අනුව ක්‍රියා කිරීමට බලපත්‍රලාභියකුට හැකිවනු පිණිස කරන හෙළිදරව් කිරීමකට,

අදාළ නොවිය යුතු ය.

මේ පනතේ කාර්ය සඳහා කවර හෝ උපක්‍රමයක් මගින්, කඩදාසියක්මත මුද්‍රිත හෝ දෘෂ්‍ය චුම්බක මාධ්‍යයක ගබඩාකර තිබෙන, පටිගත කර හෝ තැටිගත කර තිබෙන විද්‍යුත් වාර්තාවක අන්තර්ගත යම් තොරතුරක් ද ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාන්‍ය බලතල.

**16.** කොමිෂන් සභාව වෙත මේ පනතින් ප්‍රකාශිතව පවරා දී තිබෙන බලතලවලට අගතියක් නොමැතිව-

(අ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය ලබා ගැනීම අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන උපදෙස් දෙන්නන්ගේ සහ උපදේශකයන්ගේ සේවය, 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව කලින් කල ලබා ගැනීම සහ ඒ තැනැත්තන්ට කොමිෂන් සභාව නිශ්චය කරන ආකාරයකට සහ අනුප්‍රමාණ මත කොමිෂන් සභාවේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවීම ;

(ආ) නියාමනය කළ අස්ථිත්ව සමඟ එකඟවීම්වලට ඇතුළත් වීම ;

(ඇ) නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඈ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම, ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඉ) කොමිෂන් සභාවේ කර්තව්‍ය සාර්ථකව ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් අයිතිවාසිකම්, වරප්‍රසාද, බලපත්‍ර සහ අධිකාරපත්‍ර ලබා ගැනීම ;

(ඊ) ගාස්තු අය කිරීම ; සහ

(උ) මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාවේ යෙදීමට, කර්තව්‍ය ඉටුකිරීමට හෝ කාර්ය කිරීමට ආනුෂංගිකව හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ සාමාන්‍යයෙන් කළ යුතු වන වෙනත් යම් ක්‍රියා හෝ දේ කිරීම සඳහා,

කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

කොමිෂන් සභාවේ කර්තව්‍ය.

**17.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්, වෙනත් දේ අතර–

(අ) මේ පනතින් හෝ යම් කර්මාන්ත පනතකින් හෝ ඒ පනතක් යටතේ හෝ කොමිෂන් සභාව වෙත පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල ක්‍රියාවේ යෙදීම, කර්තව්‍ය ඉටු කිරීම සහ කාර්ය කිරීම කළ යුතු ය ;

(ආ) කොමිෂන් සභාවේ තීරණවල බලපෑමක් ඇතිවන හෝ ඇතිවීමට ඉඩ ඇති යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් සමඟ, උචිත යයි කොමිෂන් සභාව සලකන ප්‍රමාණයට සාකච්ඡා කළ යුතු ය ;

(ඇ) යම් කර්මාන්ත පනතක් පිළිබඳ සියලු කාරණා සම්බන්ධයෙන් යෝග්‍ය යයි කොමිෂන් සභාව සලකන පරිදි ආණ්ඩුවට උපදෙස් දිය යුතු ය ;

(ඈ) කවර හෝ මහජන උපයෝගිතා කර්මාන්තවලට අදාළ තොරතුරු, 15 වන වගන්තියේ (4) වන උපවගන්තියට යටත්ව, රැස්කිරීම, වාර්තාගත කිරීම සහ ව්‍යාප්ත කිරීම කළ යුතු ය ;

(ඉ) අවශ්‍ය පරිදි හා අවශ්‍ය වන අවස්ථාවල දී කොමිෂන් සභාවේ කර්තව්‍ය පාලනය වන යහපත් පරිචයක් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයක් ඇතුළත් නියාමන අත්පොතක් කොමිෂන් සභාව පිහිටුවා මාස හයක් ඇතුළත සකස්කර පරිශෝධනය කළ යුතු ය. ;

(ඊ) යම් කර්මාන්ත පනත්වල විධිවිධාන සලසා තිබෙන සියලු කාරණා සම්බන්ධ බලපත්‍රදීමේ, විධිමත් කිරීමේ හා පරීක්ෂණ පැවැත්වීමේ කර්තව්‍ය කළ යුතු ය ;

(ඨ) යම් කර්මාන්ත පනතක විධිවිධාන සලසා තිබෙන පරිදි බලපත්‍රවල, කොන්ත්‍රාත්තුවල සහ වෙනත් සාධන පත්‍රවල විධිවිධාන බලාත්මක කළ යුතු ය ;

(ඩ) යම් කර්මාන්ත පනතකින් නියමිත අවස්ථාවල දී, නියාමනය කළ අස්ථිත්ව විසින් අයකරන තිරු ගාස්තු හා වෙනත් ගාස්තු විධිමත් කළ යුතු ය ;

(ඪ) යම් මහජන උපයෝගිතා කර්මාන්තයක උද්ගතවන ආරාවුල්, මැදිහත් වීමෙන් නිශ්වය කළ යුතු ය ;

(ඣ) මහජන උපයෝගිතා කර්මාන්තවල ආරක්ෂාව, තත්ත්වය, අඛණ්ඩ පැවැත්ම හා විශ්වාසනියත්වය පිළිබඳ තාක්ෂණික හා වෙනත් ප්‍රමිති නියම කර බලාත්මක කළ යුතු ය ; තවද

(ඬ) කොමිෂන් සභාවේ කිසියම් කර්තව්‍යයක් සාර්ථකව ඉටු කිරීම සඳහා යෝග්‍ය බව කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් ආනුෂංගික හෝ උපයෝගී ක්‍රියාකාරකම් කළ යුතු ය.

**18.** (1) කොමිෂන් සභාව වෙත මේ පනතින් හෝ වෙනත් යම් කර්මාන්ත පනතකින් හෝ ඒ පනතක් යටතේ හෝ කොමිෂන් සභාව වෙත පැවරී ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ දී සහ මහජන යහපත පිණිස අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන අවස්ථාවක දී, යම් කාරණයක් විනිශ්වය කිරීම පිණිස ප්‍රසිද්ධ විභාගයක් පැවැත්විය හැකි ය. ඒ ප්‍රසිද්ධ විභාගය ස්වාභාවික යුක්ති ධර්මය පිළිබඳ මූලධර්මවලට අනනුකූල නොවන කවර හෝ ආකාරයකින් පැවැත්විය හැකි ය. ප්‍රසිද්ධ විභාග.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රසිද්ධ විභාගයක, කාර්ය සඳහා කොමිෂන් සභාවට පහත සඳහන් බලතල ඇත්තේ ය :-

(අ) ලබාගැනීම අවශ්‍ය හෝ යෝග්‍ය බව කොමිෂන් සභාව කල්පනා කරන සියලු ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම සහ ප්‍රශ්න කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය බව කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් සාක්ෂිකරුවන් ලෙස ප්‍රශ්න කිරීම ;

(ආ) යම් සාක්ෂිකරුවකුගේ (ලිඛිත හෝ වාචික) සාක්ෂි දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත දෙන ලෙස නියම කිරීම සහ තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ නිලධරයකු ලවා සෑම සාක්ෂිකරුවකුගේම දිවුරුම හෝ ප්‍රතිඥාව ලබා ගැනීමට සැලැස්වීම ;

(ඇ) කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ විභාගයකට පැමිණෙන ලෙස ශ්‍රී ලංකාවේ පදිංචි කවර හෝ තැනැත්තකු හෝ තැනැත්තියක සාක්ෂි දීම හෝ ඔහු හෝ ඇය සන්තකයේ තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා කැඳවීම සහ ඔහු හෝ ඇයගෙන් සාක්ෂිකරුවකු හෝ සාක්ෂිකාරියක ලෙස ප්‍රශ්න කිරීම හෝ ඔහුට හෝ ඇයට ඔහු හෝ ඇය භාරයේ තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ;

(ඇ) සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව තිබුණ ද, ලිඛිත හෝ වාචික සාක්ෂියක් ආවේශ්‍ය කර ගැනීම.

(3) කැඳවනු ලැබූ හෝ කොමිෂන් සභාව හමුවේ තිබෙන යම් කාරණයකින් බලපෑමක් ඇතිවිය හැකි කවර හෝ තැනැත්තකුට හෝ තැනැත්තියකට පෞද්ගලිකව ම හෝ බලය දෙනු ලැබූ නියෝජිතයකු මගින් හෝ පෙනී සිටිය හැකි ය.

(4) එවැනි ප්‍රසිද්ධ විභාගයක දී සාක්ෂි දෙන සෑම තැනැත්තකුට ම හෝ තැනැත්තියකට ම යම් අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට හෝ සාක්ෂිකාරියකට ඔහු හෝ ඇය විසින් ඒ අධිකරණය හමුවේ දෙන සාක්ෂිවලට අදාළව හිමිකම තිබෙන සියලු වරප්‍රසාදවලට, හිමිකම තිබිය යුතු ය.

(5) එවැනි යම් විභාගයක නිති කෘත්‍ය මහජනයා සඳහා විවෘතව පැවැත්වෙන අතර, දෙන ලද සාක්ෂිවල වාර්තාවක් සහ සැලකිල්ලට ගන්නා ලද සියලු කරුණු ඇතුළුව එම නිතිකෘත්‍ය වාර්තා කොමිෂන් සභාව විසින් තබාගත යුතු ය ; තවද ඒ වාර්තා මහජනයාට ලබාගත හැකි පරිදි තැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ එයට අගරුවන පරිදි කරන ලද සෑම අපහාස වරදකට ම, එය, අභියාචනාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ එයට අගරුවන පරිදි කරන ලද වරදක් සේ, අභියාචනාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය හැකි විය යුතු අතර ඒ සෑම වරදක් ම විභාග කිරීම සඳහා අභියාචනාධිකරණයට මෙයින් බලය පැවරේ.

(7) අභියාචනාධිකරණය හා සම්බන්ධව කරන ලද නම් ඒ අධිකරණයේ අධිකාර බලයට විරුද්ධව හෝ එයට අගරුවන පරිදි කරන ලද අපහාස වරදක් සංයුක්ත විය හැකිව තිබුණු යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් කොමිෂන් සභාව සම්බන්ධයෙන්, කොමිෂන් සභාව ඉදිරිපිට හෝ අන්‍යාකාරව කරනු ලැබුවහොත්, එයින් කොමිෂන් සභාවේ අධිකාර බලයට විරුද්ධව හෝ එයට අගරුවන පරිදි කරන ලද අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(8) (අ) කොමිෂන් සභාව නිකුත් කළ සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, හේතුවක් නොමැතිව පැහැර හරින ; හෝ

(ආ) දිවුරුම හෝ ප්‍රතිඥාව දීම ප්‍රතික්ෂේප කරන හෝ යථා පරිදි දිවුරුම හෝ ප්‍රතිඥාව ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් විභාග කරගෙන යන කාරණයට අදාළව ඔහුගෙන් හෝ ඇයගෙන් නීත්‍යානුකූලව විමසන ප්‍රශ්නයට පිළිතුරු දීම හේතුවක් නොමැතිව පැහැර හරින ; හෝ

(ඇ) තමාගේ සන්තකයේ හෝ බලය යටතේ තිබෙන සහ කොමිෂන් සභාව විභාග කරගෙන යන කාරණයේ සත්‍යතාව තීරණය කිරීම සඳහා කොමිෂන් සභාවේ මතය අනුව අවශ්‍ය වන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක්, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම හෝ පෙන්වීම, හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින,

යම් තැනැත්තෙක්, කොමිෂන් සභාවේ අධිකාරයට එරෙහිව හෝ ඊට ගරුසරුවකින් තොරව අපහාස කිරීමේ වරදකට වරදකරු විය යුතු ය.

(9) ප්‍රසිද්ධ විභාගයක් පවත්වාගෙන යාමේ දී හෝ ඒ විභාගයක් නිමවීමේ දී කොමිෂන් සභාව විසින්,-

(අ) එය ඉදිරියේ ඇති කාරණයක් හෝ කාරණයකින් කොටසක් හා සම්බන්ධව නියමයක් හෝ තීරණයක්, ඊට හේතු ද සහිතව, කරනු ලැබිය හැකි ය; නැතහොත් හේතු ද සහිතව, ඒ පිළිබඳ විධානයක් කරනු ලැබිය හැකි ය ;

(ආ) විභාගවන කාරණය හෝ එහි කොටසක් නොවැදගත් හෝ පීඩාකාරී බව හෝ වැඩිදුර නීති කෘත්‍ය පවත්වාගෙන යාම මහජන යහපත පිණිස අවශ්‍ය නොවන බව හෝ අභිමත නොවන බව පෙනී ගියහොත් එම කාරණය හෝ එහි කොටසක් නිෂ්ප්‍රභ කිරීම හෝ වැඩිදුර විභාග කිරීමෙන් වැළකී සිටීම හෝ එම කාරණය හෝ එහි කොටසක් පිළිබඳ තීරණයක් දීමෙන් වැළකී සිටීම කළ හැකි ය, ;

(ඇ) කොමිෂන් සභාව ඉදිරියේ ඇති කාරණය කඩිනමින් හා යුක්තිසහගතව විභාග කිරීම හා විනිශ්චය කිරීම පිණිස අවශ්‍ය සියලු විධාන දීම හා අවශ්‍ය සියලු දේ කළ හැකි ය.

(10) (9) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර කරන ලද සෑම නියමයක් ම හෝ තීරණයක් ම සහ දෙන ලද සෑම විධානයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර ඒ සෑම නියමයක්, තීරණයක් හෝ විධානයක් ම ඒ ප්‍රසිද්ධ විභාගයේ එක් එක් පාර්ශ්වය වෙත භාර කළ යුතු ය.

**18 වන වගන්තිය යටතේ කරන නියමයන් නීති ප්‍රශ්නයක් මත අභියාචනයට යටත්ව, අවසානාත්මක බව.**

**19.** (1) කොමිෂන් සභාව විසින් 18 වන වගන්තිය යටතේ කරන ලද නියමයක්, තීරණයක් හෝ විධානයක්, (2) වන උපවගන්තියට යටත්ව අවසානාත්මක විය යුතු ය.

(2) 18 වන වගන්තිය යටතේ කරන ලද නියමයකින්, තීරණයකින් හෝ විධානයකින් අතෘප්ත යම් තැනැත්තකු හෝ තැනැත්තියක විසින් නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අභියාචනයක්, ලිඛිත පෙත්සමක් මගින් විය යුතු අතර, එය -

(අ) නියමය, තීරණය හෝ විධානය අභියාචක වෙත දැනුම් දුන් ලියවිල්ලේ දිනයෙන් පසු දවස් තිහක් ඇතුළත කොමිෂන් සභාව වෙත පිටපත් තුනකින් යුතුව ඉදිරිපත් කළ යුතු ය;

(ආ) කොමිෂන් සභාවේ නියමය, තීරණය හෝ විධානය සහ තර්ක කිරීමට අදහස් කරන නිති ප්‍රශ්නය එහි ගෙනහැර දැක්විය යුතු ය ;

(ඇ) අවශ්‍ය යම් පාර්ශ්වයක්, අභියාචනයේ වගඋත්තරකරුවකු කළ යුතු ය ; සහ

(ඈ) කොමිෂන් සභාවේ අරමුදලට ගෙවිය යුතු රුපියල් එක් දහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන ආකාරයට සහ කාලසීමාව ඇතුළත අභියාචන පෙත්සමක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින්-

(අ) පෙත්සමේ පිටපතක්, පෙත්සමේ සඳහන් නියමය, තීරණය හෝ විධානය දෙන ලද්දේ හෝ කරන ලද්දේ යම් නිති කෘත්‍යයක දී ද එකී නීතිකෘත්‍ය වාර්තාව ද සමග අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය ; නැතහොත් යැවීමට සැලැස්විය යුතු ය ;

(ආ) අභියාචනය පිළිබඳ දැන්වීමක්, අභියාචනයේ නම් කර තිබෙන වගඋත්තරකරු වෙත, පෙත්සමේ පිටපතක් ද සමඟ නිකුත් කළ යුතු ය ; නැතහොත් නිකුත් කිරීමට සැලැස්විය යුතු ය ; සහ

(ඇ) පෙත්සමේ පිටපතක් වාර්තාවට ගොනුකළ යුතු ය ; නැතහොත් ගොනු කිරීමට සැලැස්විය යුතු ය.

(5) එම නීතිය පිළිබඳ ප්‍රශ්නය විනිශ්චය කිරීමේ දී, අභියාචනාධිකරණය විසින්, කොමිෂන් සභාවේ නියමය, තීරණය හෝ විධානය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ නීති ප්‍රශ්නය පිළිබඳව අධිකරණයේ තීරණය, උචිත යයි සැලකෙන යම් විධාන ද සමඟ කොමිෂන් සභාව වෙත යැවීම කරනු ලැබිය හැකි ය.

ලේඛන සාක්ෂි.

**20.** කොමිෂන් සභාව විසින් කරන ලද හෝ කොමිෂන් සභාව භාරයේ තිබෙන එහි යම් රීතියක, නියමයක, තීරණයක, විධානයක හෝ වෙනත් යම් ලේඛනයක සත්‍ය පිටපතක් බවට සභාපතිවරයා විසින් සහතික කරන ලද, යම් රීතියක, නියමයක, තීරණයක, විධානයක හෝ වෙනත් ලේඛනයක පිටපතක්, සභාපතිවරයාගේ අත්සන ඔප්පු කිරීමකින් තොරව, ඒ රීතිය, නියමය, තීරණය, විධානය හෝ වෙනත් ලේඛනය පිළිබඳ සාක්ෂියක් ලෙස කවර හෝ අධිකරණයක දී සලකනු ලැබිය යුතු ය.

නියමයක් තීරණයක් හෝ විධානයක් උල්ලංඝනය කිරීම.

**21.** කොමිෂන් සභාවේ නියමයක්, තීරණයක් හෝ විධානයක් අනුව කටයුතු කිරීම, නීත්‍යානුකූල බලයකින් තොරව උල්ලංඝනය කරන හෝ පැහැරහරින කවර හෝ තැනැත්තකු වරදකට වරදකරුවන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තවද ඒ වරද අඛණ්ඩ වරදක් වන අවස්ථාවක, ඒ උල්ලංඝනය කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රුපියල් පන්ලක්ෂයක වැඩිදුර දඩයකට යටත් විය යුතු ය.

## V වන කොටස

### තරගකාරීත්වය

තරඟකාරීත්වය පිළිබඳව කොමිෂන් සභාවේ කර්තව්‍ය.

**22.** එක් එක් මහජන උපයෝගිතා කර්මාන්තය හා සම්බන්ධව, කොමිෂන් සභාව විසින් තරඟ – විරෝධී පරිචය, ඒකාධිකාර, ප්‍රබල තත්ව අත්කර ගැනීම සහ එම තත්ව අනිසි ලෙස යෙදීම හා ඒකාබද්ධ කිරීමේ තත්ත්වයන් විධිමත් කිරීම, හා ඒවා පිළිබඳ පරීක්ෂණ කළ යුතු අතර සිය වෙහෙසීමෙන්ම හෝ යම් තැනැත්තකු හෝ තැනැත්තියක විසින් කොමිෂන් සභාව වෙත,

(අ) යම් තරඟ – විරෝධී ක්‍රියාවක් පවතින බවට හෝ පැවතීමේ සැකයක් පවතින බවට ;

(ආ) නියාමනය කළ කර්මාන්තයක් ක්‍රියාත්මක වන වෙළෙඳපළ ඒකක හෝ වැඩි සංඛ්‍යාවක දේශීය වෙළෙඳ කටයුතු හෝ ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි ප්‍රබල තත්ත්වයක් අත්කර ගැනීම, පැවතීම හෝ පැවතීමේ සැකයක් පවතින බවට ;

(ඈ) ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් ඇති කිරීම හෝ ඒ තත්ත්වයක් ඇති කිරීමේ සැකයක් පවතින බවට,

කරන පැමිණිල්ලක් මත හෝ එවැන්නක් දැනගන්නට ලැබීම මත, එහි බලපෑමකට පාත්‍රවන හෝ පාත්‍රවීමට ඉඩ තිබෙන යම් නියමනය කළ අස්ථිත්වයක් ද පැමිණිලිකරු ද පිහිටුවා තිබෙන යම් පාරිභෝගික උපදේශක කමිටුවක් ද විමසා, කොමිෂන් සභාව විසින් විමර්ශනයක් පවත්වනු ලැබිය යුතු ය.

තරගකාරිත්වය පිළිබඳව කොමිෂන් සභාවේ කර්තව්‍ය සඳහා උපමාන.

**23.** (1) 22 වන වගන්තියේ කාර්ය සඳහා, දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාම කෙරෙහි බලපාන හෝ බලපෑමට ඉඩ ඇති සහ ශ්‍රී ලංකාව තුළ තරගකාරිත්වය වැළැක්වීම, සීමා කිරීම හෝ විකෘති කිරීම අරමුණු කරගත් හෝ වැළැක්වීමේ, සීමා කිරීමේ හෝ විකෘති කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන -

(අ) (i) යම් ලියවිල්ලකින් හෝ වාචිකව හෝ ක්‍රියාකලාපය අනුව වූ, නියාමනය කළ අස්ථිත්වයක් සම්බන්ධ වී තිබෙන යම් ගිවිසුමකින් ;

(ii) එක්ව ක්‍රියාකරන, නියාමනය කළ අස්ථිත්වවල යම් තීරණයකින් ; හෝ

(iii) නියාමනය කළ අස්ථිත්ව එකක් හෝ වැඩි සංඛ්‍යාවක පරිචයෙන් හෝ ක්‍රියාකලාපයෙන්,

තරඟ - විරෝධී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය.

(ආ) 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන, විශේෂයෙන් ම-

(i) ගැනුම් මිල හෝ විකුණුම් මිල කෙළින්ම හෝ අන්‍යාකාරව නියම කරන්නා වූ ;

(ii) වෙළෙඳපොලක තරගකරුවකු ඉවත් කරන හෝ තරගකරුවකුට සැලකිය යුතු අලාභ සිදුකරන්නා වූ ;

(iii) වෙළෙඳපොළකට තරගකරුවකු ඇතුළුවීම වළක්වන්නා වූ ;

(iv) වෙළෙඳපොලෙහි තරගකාරී ක්‍රියාකාරිත්වයක යෙදීමට යම් තැනැත්තකුට අවහිර කරන හෝ යෙදීම වළක්වන්නා වූ ;

(v) පාරිභෝගිකයකුට නියාමනය කළ අස්ථිත්වයකට ඇති ප්‍රවේශය හෝ නියාමනය කළ අස්ථිත්වයකට හෝ අස්ථිත්වයකින් හෝ මාරුවීමේ හැකියාව අනිසි ලෙස සීමා කරන්නා වූ හෝ පාලනය කරන්නා වූ,

ගිවිසුම්, තීරණ, පරිචය හෝ ක්‍රියාකලාපය කෙරෙහි අදාළ විය යුතු ය.

(ඇ) (i) උපයෝගිතා ජාලයක නියමිත ප්‍රතිශතයක් එකම තැනැත්තකු විසින් පාවිච්චි කරන්නේ නම් හෝ එකම තැනැත්තකුට සපයනු ලබන්නේ නම් හෝ උපයෝගිතා සේවයක නියමිත ප්‍රතිශතයක් එකම තැනැත්තකු විසින් හෝ එකම තැනැත්තකුට සපයනු ලබන්නේ නම් ; හෝ

(ii) උපයෝගිතා ජාලයක නියමිත ප්‍රතිශතයක්, සම්බන්ධිත සංස්ථාගත මණ්ඩල ද ඇතුළු පුද්ගල කණ්ඩායමක සාමාජිකයන් විසින් පාවිච්චි කරන්නේ නම් හෝ ඒ පුද්ගල කණ්ඩායමක සාමාජිකයන්ට සපයනු ලබන්නේ නම් හෝ උපයෝගිතා සේවයක නියමිත ප්‍රතිශතයක්, සම්බන්ධිත සංස්ථාගත මණ්ඩල ද ඇතුළු පුද්ගල කණ්ඩායමක සාමාජිකයන් විසින් හෝ සාමාජිකයන්ට සපයනු ලබන්නේ නම්,

ප්‍රමුඛ තරාතිරමක් පවත්නා ලෙස සැලකිය යුතු ය.

(ඈ) කටයුතු කරන ආකාරය මගින් විශේෂයෙන්, –

(i) ගැනුම් මිල හෝ විකුණුම් මිල කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් නියම කරන්නේ නම් ;

(ii) වෙළෙඳපොල තරඟකරුවකු ඉවත් කෙරෙන්නේ නම් තරඟකරුවකුට සැලකිය යුතු අලාභ සිදු කෙරෙන්නේ නම් ;

(iii) වෙළෙඳපොලට තරඟකරුවකු ඇතුළුවීම වැළැක්වෙන්නේ නම් ;

(iv) වෙළෙඳපොලෙහි තරඟකාරී ක්‍රියාකාරිත්වයක යෙදීමෙහි ලා යම් තැනැත්තකුට අවහිර කෙරෙන්නේ නම් හෝ ඒ ක්‍රියාකාරිත්වයෙහි යෙදීම වැළැක්වෙන්නේ නම් ;

(v) පාරිභෝගිකයකුට, නියාමය කළ අස්ථිත්වයකට ඇති ප්‍රවේශවීම හෝ නියාමනය කළ අස්ථිත්වයකට හෝ අස්ථිත්වයකින් හෝ මාරුවීමේ හැකියාව අනිසි ලෙස සීමා කරන්නේ නම් හෝ පාලන කෙරෙන්නේ නම්,

එයින් ප්‍රමුඛ තරාතිරම අනිසි ලෙස යෙදීම සංයුක්ත වේ.

(ඉ) සංස්ථාපිත මණ්ඩලයක් ද ඇතුළු යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකුගේ පාලනයෙහි වෙනසක් කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන හෝ ඒ ප්‍රතිඵලය ඇතිවිය හැකි පරිදි වෙනත් යම් තැනැත්තකුගේ යම් කොටස් හෝ වත්කම් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් අත්කරගතහොත් හෝ අත්කර ගැනීමට අදහස් කළහොත්-

(i) ඒ අත්කර ගැනීමේ අරමුණ හෝ ප්‍රතිඵලය වන්නේ ඒ තැනැත්තන් එක්ව ගත්විට යම් මහජන උපයෝගිතා කර්මාන්ත වෙළෙඳපොලක ප්‍රමුඛ තත්ත්වයක සිටීම හෝ ප්‍රමුඛ තත්ත්වයකට පත්වීමට ඉඩතිබීම හෝ පත්වනු ලැබිය හැකිවීම වන විට ; හෝ

(ii) ඒ තැනැත්තන් දෙදෙනාම, අනන්‍යව හෝ අන්‍යාකාරව, මහජන උපයෝගිතා කර්මාන්තයක එකම උපයෝගිතා ජාලයක් හෝ මහජන උපයෝගිතා සේවාවක් ඇතුළත එකම හෝ එකිනෙකට වෙනස් භූගෝලීය ප්‍රදේශවල උපයෝගිතා සේවා සැපයීමෙහි යෙදී සිටින සහ ඒ උපයෝගිතා ජාලයේ හෝ උපයෝගිතා සේවයේ ප්‍රමුඛ තත්ත්වයක් දරන අවස්ථාවක,

ඒකාබද්ධවීමේ තත්ත්වයක් පවත්නා ලෙස සැලකිය යුතු ය.

(ඊ) 22 වන වගන්තියේ ගෙනහැර දැක්වෙන ක්‍රියාකාරකම්වල විෂය පථයට අයත් වියහැකි බව ස්වකීය මතය වන හෝ සාධාරණව එම මතය දැරිය යුතු වන සහ විමර්ශනය කිරීමට කොමිෂන් සභාවට බලය තිබෙන යම් නියාමනය කළ අස්ථිත්වයක් විසින් ඒ බව වහාම කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

(2) මේ වගන්තියෙහි –

"පාලනය" යන්නෙන්, වෙනත් එක් තැනැත්තකු හෝ වැඩි සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම හෝ ඒවායේ කොටස් කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ පාලනය කිරීම අදහස් වේ ;

"උපයෝගිතා ජාලය" යන්නෙන්, යම් කර්මාන්ත පනතක කවර ආකාරයකින් අර්ථ කථනය කර තිබුණ ද උපයෝගිතා සේවා සැපයීම් සඳහා ඇති ජාලයක් හෝ ක්‍රම පද්ධතියක් අදහස් වේ ; සහ

"උපයෝගිතා සේවා" යන්නෙන්, මහජන උපයෝගිතා කර්මාන්තවල සිදුකෙරෙන භාණ්ඩ හෝ සේවා සැපයීම අදහස් වේ.

කොමිෂන් සභාව සතු තරඟකාරිත්වය බලාත්මක කිරීමේ බලතල.

**24.** (1) තරඟ-විරෝධී ක්‍රියාවක් හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් පවතින බවට, එහෙත්, එය මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක නොවන බවට හෝ ක්‍රියාත්මකවීමේ ඉඩක් නොපවතින බවට, විමර්ශනයකින් පසු කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, අවශ්‍ය යයි හෝ උචිත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, එම තරඟ විරෝධී ක්‍රියාවට හෝ ඒකාබද්ධ වීමේ තත්ත්වයට කොමිෂන් සභාව විසින් නියමයක් මගින් බලය දිය යුතු ය.

(2) ප්‍රමුඛ තත්ත්වයක් පවතින බවට එහෙත් එම ප්‍රමුඛ තත්ත්වය අනිසි ලෙස යොදා ගැනීමක් නොපවතින බවට, විමර්ශනයකින් පසුව කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, ප්‍රමුඛ තත්ත්වය අනිසි ලෙස යොදාගැනීමක් සිදු වී නොමැති බව, අවශ්‍ය යයි හෝ උචිත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ප්‍රකාශයට පත්කළ යුතු ය.

(3) විමර්ශනයකින් පසුව –

(අ) ඒකාබද්ධ වීමේ තත්ත්වයක් පවතින බවට සහ එය මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වීමට ඉඩ ඇති බවට සහ ඒකාබද්ධ වීම එතෙක් සිදු වී නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් නියමයක් මගින්, එම ඒකාබද්ධ වීමේ තත්ත්වය තහනම් කළ හැකි ය ;

(ආ) (අ) ඡේදයට අගතියක් නොමැතිව, තරග විරෝධී ක්‍රියාවක් හෝ ඒකාබද්ධ වීමේ තත්ත්වයක් පවතින බව සහ එය මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වන බවට හෝ ප්‍රමුඛ තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනිමක් සිදුවන බවට කොමිෂන් සභාව සෑහිමට පත් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් නියමයක් මගින්–

(i) යම් ක්‍රියාකාරකමක් කරගෙන යාම අධීක්ෂණය හෝ යම් වත්කම් ආරක්ෂා කිරිම සඳහා නියමයේ නිශ්චය කොට දක්වනු ලැබිය හැකි යම් නියමයක් මත සහ යම් බලතල ඇතිව තැනැත්තකු පත් කිරිම මගින්, ඒ යම් ක්‍රියාකාරකමක් කරගෙන යාම හෝ යම් වත්කම් ආරක්ෂා කිරිම සඳහා විධිවිධාන යෙදිය හැකි ය ;

(ii) නියමයේ නිශ්චය කොට දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට, යම් තරග විරෝධී ක්‍රියාවක් හෝ ප්‍රමුඛ තත්ත්වයක් අනිසි ලෙස යෙදිම හෝ ඒකාබද්ධ වීමේ තත්ත්වයක් අවසන් කිරිම සඳහා විධිවිධාන යෙදිය හැකි ය ;

(iii) අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි කොමිෂන් සභාව සලකන යම් කොන්දේසිවලට යටත්ව, එකී කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන අහිතකර බලපෑම් සඳහා ප්‍රතිකර්ම යෙදිමේ හෝ වැළැක්වීමේ කාර්යය සඳහා, අවස්ථාගත තත්ත්වය අනුව අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන ක්‍රියාමාර්ග සඳහා කොමිෂන් සභාව විසින් විධිවිධාන යෙදිය හැකි ය.

(4) යම් තරඟ විරෝධී ක්‍රියාවක් හෝ ඒකාබද්ධවීමේ තත්ත්වයක් මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වන්නේ ද යන බව හෝ ක්‍රියාත්මක වීමට ඉඩ ඇත්තේ ද යන බව මේ වගන්තියේ කාර්ය සඳහා නිශ්චය කිරීමේ දී, විමර්ශනයට විෂයය වී තිබෙන කාරණයට අදාළ යයි කොමිෂන් සභාවට පෙනි යන සියලු කරුණු සැලකිල්ලට ගත යුතු අතර–

(අ) නියාමනය කළ අස්ථිත්ව අතර සාර්ථක තරගකාරීත්වයක් පවත්වා ගැනිමේ සහ ප්‍රවර්ධනය කිරීමේ යෝග්‍යතාව ; සහ

(ආ) තරඟ විරෝධී ක්‍රියාවක් හෝ ඒකාබද්ධ වීමේ තත්ත්වයක් ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක වීමට ඉඩ තිබෙන වෙළෙඳපොලක් හා සම්බන්ධ පාරිභෝගිකයන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ යෝග්‍යතාව ; සහ

ඒකාබද්ධවීමේ තත්ත්වයක් පවත්නා අවස්ථාවක දී, මීට අමතරව,

(ඇ) එකම මහජන උපයෝගිතා කර්මාන්තයක, නියාමනය කළ එකිනෙකට වෙනස් වූ අස්තිත්ව අතර සංසන්දනයක් කිරීමේ කර්තව්‍ය කරගෙන යාමට කොමිෂන් සභාව සතු හැකියාවට හානියක් වන පරිදි, ස්වාධීන පාලනය යටතේ පවතින නියාමනය කළ අස්තිත්ව සංඛ්‍යාව අඩු නොකළ යුතු ය යන මූලධර්මය බලාත්මක කිරීමේ යෝග්‍යතාවය,

කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(5) 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව පවත්වන පරීක්ෂණයකට හෝ විමර්ශනයකට විෂයය වී තිබෙන යම් නියාමනය කළ අස්තිත්වයකට, කරුණු කියා සිටීමට හා වාචික හෝ ලේඛන සාක්ෂි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතු ය.

ඇතුල්වීමේ, පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ බලය.

**25.** (1) 22 වන වගන්තිය යටතේ යම් ක්‍රියාකාරකමක් පවතින බව කොමිෂන් සභාව සාධාරණ ලෙස විශ්වාස කරන අවස්ථාවක, 15 වන වගන්තියට අගතියක් නොමැතිව, කොමිෂන් සභාවට, යුක්ති සහගත හේතු මත, මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරන ලද ඇතුළුවීමේ වරෙන්තුවක් ඇතිව සහ මහෙස්ත්‍රාත්වරයා නිකුත් කළ ඇතුළුවීමේ වරෙන්තුව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියහොත් එය ඉදිරිපත් කර–

(අ) යම් නියාමනය කළ අස්තිත්වයක් එහි ව්‍යාපාරය කරගෙන යන යම් පරිශ්‍රයකට හෝ වෙනත් යම් පරිශ්‍රයකට හෝ දවසේ යුක්ති සහගත ඕනෑම වේලාවක ඇතුළුවීමේ, එය පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලය ; සහ

(ආ) නියාමනය කළ අස්තිත්වයේ යම් අදාළ වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීමේ, ඒවායේ පිටපත් ගැනීමේ හෝ ඒවා තහනමට ගෙන රඳවා ගැනීමේ බලය,

තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද කොමිෂන් සභාවේ නිලධරයෙකු ලවා ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමෙහි ලා ක්‍රියා කරන යම් නිලධරයකුට හෝ නිලධාරිනියකට කිසිම තැනැත්තකු විසින් බාධා කරනු නොලැබිය යුතු ය.

**26.** (1) හැකිතාක් දුරට, මේ කොටස යටතේ මහජන උපයෝගිතා කර්මාන්ත අතර තරගකාරීත්වය නියාමනය කිරීම පිළිබඳව උද්ගතවන ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, මේ හා සම්බන්ධ විධිවිධාන අතර පවතින මීට අදාළ පරස්පර පිළිබඳව සැලකිලිමත්ව, අදාළ පනත යටතේ මතුවන ඊට අනුරූප ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයට අනුකූලව සිදු කරන බවට කොමිෂන් සභාව වගබලාගත යුතු ය. අදාළ කරගත යුතු මූලධර්ම.

(2) මේ කොටස යටතේ ප්‍රශ්නයක් විසඳීමේ දී අදාළ බලධරයා විසින් ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීමට උපයෝගී කරගන්නා මූලධර්මවලට සහ එළඹෙන යම් තිරණවලට අනනුකූලතාවක් නොවන බවට සහතික වීම පිණිස, කොමිසන් සභාව, හැකිතාක් දුරට මේ කොටසේ විධිවිධානවලට විරුද්ධ නොවන සේ ක්‍රියා කළ යුතු අතර, ඊට අමතරව, කොමිෂන් සභාව අදාළ බලධරයාගේ යම් අදාළ තීරණ හෝ ප්‍රකාශ පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "අදාළ බලධරයා" යන්නෙන්, මහජන උපයෝගිතා කර්මාන්ත නොවන කර්මාන්ත සඳහා අදාළ පනතක් යටතේ මේ හා සමාන කරගකාරීත්වය විටිමත් කිරීමේ කර්තව්‍ය භාර, ව්‍යවස්ථාපිත නියාමන බලධරයා අදහස් වේ.

**27.** (1) අදාළ වගකීමකට අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට– වැරදි හා දණ්ඩන.

(අ) ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් නොවන අවස්ථාවක රුපියල් මිලියන එකකට නොඅඩු සහ මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය ;

(ආ) ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක රුපියල් මිලියන දහයකට නොඅඩු සහ රුපියල් මිලියන සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

(ඇ) මේ අවස්ථා දෙකෙන් කවර අවස්ථාවක වුවද ඒ වරද අඛණ්ඩ වරදක් නම්, ඒ උල්ලංඝනය කරගෙන යන එක් එක් දවස සඳහා වැඩිදුර රුපියල් ලක්ෂ පහක දඩයකට යටත් විය යුතු ය,

තව ද, අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි යම් කාලයකට හෝ ඒ වගන්තිය යටතේ කරන ලද නියමයට අනුකූලව ඒ තැනැත්තා විසින් ක්‍රියා කරනු ලබන තෙක් කොමිෂන් සභාවේ කලින් නියමය යටතේ අවසන් කිරීමට නියමිතව තිබුණු එකී ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් වළකින ලෙස හෝ කිරීමට නියමිතව තිබුණු වෙනත් ක්‍රියා කරන ලෙස, අධිකරණය විසින් ඊට අමතරව එවැනි තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ වරදකරු කරනු ලබන සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපින, සුදුසු යයි කොමිෂන් සභාව කල්පනා කරන යම් ආකාරයකට කොමිෂන් සභාව විසින් පළ කිරීම හෝ පළකිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

(3) යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද අවස්ථාවක–

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එහි සෑම හවුල්කරුවකුම,

වරදකට වරදකරු විය යුතු ය : එසේ වුව ද, ඒ වරද සිදුකර ඇත්තේ තමාගේ අනුදැනුමක් නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු විසින් අධිකරණය සෑහීමට පත් වන පරිදි තහවුරු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි "අදාළ වගකීම" යන්නෙන්, යම් තැනැත්තකු වෙත මේ කොටස යටතේ පැවරී ඇති වගකීමක් හෝ මේ කොටසට අදාළ වන තැන් හි දී 15 වන වගන්තිය යටතේ වගකීම හෝ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද නියමයක් යටතේ වගකීම හෝ ඒ නියමයක් උල්ලංඝනය වන ක්‍රියා අදහස් වේ.

## VI වන කොටස

### පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව

**28.** යම් කර්මාන්ත පනතක් යටතේ හෝ ඒ පනතක් යටතේ සාදන ලද නියෝගයක් යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී කොමිෂන් සභාව විසින්- පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව.

(අ) ජීවිතවලට හා දේපළවලට අන්තරායකාරී භාණ්ඩ හා සේවා අලෙවිකිරීමට එරෙහිව පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ;

(ආ) අසාධාරණ වෙළෙඳ ක්‍රියාවන්ට එරෙහිව, පාරිභෝගික අයිතිවාසිකම් ;

(ඇ) කරුණු කියා සිටීමට සහ පාරිභෝගික අයිතීන් කෙරෙහි නිසි සැලකිල්ලක් සහතික වීමේ අයිතිවාසිකම් ; සහ

(ඈ) පාරිභෝගික අධ්‍යාපන අයිතිවාසිකම්,

ආරක්ෂා කළ යුතු ය.

**29.** (1) කොමිෂන් සභාව විසින්, අමාත්‍යවරයා විමසීමෙන් පසුව, පාරිභෝගික උපදේශක කමිටුවක් පත් කළ යුතු ය. පාරිභෝගික උපදේශක කමිටු.

(2) කමිටුවේ සංයුතිය, නියෝග මගින් නියමිත පරිදි විය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතු හෝ තීරණය කරනු ලැබිය යුතු උචිත ප්‍රමිති පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් දීම ;

(ආ) යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් විසින් සපයනු ලබන පාරිභෝගිකයින්ගේ භාණ්ඩ හා සේවා අවශ්‍යතා සපුරනු ලබන්නේ ද යන වග නිරීක්ෂණය කිරීම ; සහ

(ඇ) මේ පනත යටතේ නියම කරන හෝ තීරණය කරන ප්‍රමිති පිළිබඳව හා ඒ ප්‍රමිතිවලට අදාළව පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම,

කමිටුවේ කර්තව්‍ය විය යුතු ය.

## VII වන කොටස

### ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ

පොදු ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයා මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

**30.** (1) අමාත්‍ය මණ්ඩලය විසින්, මහජන උපයෝගිතා කර්මාන්තයක් භාර අමාත්‍යවරයා විමසා, යෝග්‍ය යයි පෙනෙන තැන්හිදී–

(අ) ඒ කර්මාන්ත පනතෙහි හෝ එය යටතේ පොදු ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සකස් කළ යුතු ලෙස හඳුනාගත් යම් කාරණයක් පිළිබඳව ;

(ආ) වෙනත් දේ අතර,–

(i) ග්‍රාමීය ප්‍රදේශ ද ඇතුළත් වන විවිධ භූගෝලීය ප්‍රදේශවල ; සහ

(ii) විවිධ සමාජ-ආර්ථික කණ්ඩායම්වල තිරසාර ආර්ථික වර්ධනය පිළිබඳ ජාතික ඉලක්ක සපුරා ගැනීම පිණිස, ඒ කර්මාන්ත පනත යටතේ මහජන උපයෝගිතා සේවා සැපයීමේ අවශ්‍යතාව පිළිබඳව ;

(ඇ) (ආ) ඡේදය යටතේ හඳුනාගත් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම පිණිස ආණ්ඩුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ; සහ

(ඈ) ප්‍රමුඛතා නියම කිරීම සහ (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දැක්වෙන අරමුණු සපුරා ගැනීම පිළිබඳව,

පොදු ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සකස් කර, අමාත්‍යවරයා මගින් කොමිෂන් සභාව වෙත නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් පොදු ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවල ප්‍රතිඵලයක් වශයෙන්, යම් සමාජ ආර්ථික කණ්ඩායමකට හෝ භූගෝලීය ප්‍රදේශයකට, මහජන උපයෝගිතා කර්මාන්තයක් සැපයෙන යම් සේවාවක් සඳහා නියාමනය කළ අස්ථිත්වයක් විසින් සහනාධාර සැපයීමේ අවශ්‍යතාව මතුවන අවස්ථාවක, එම ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමේ දී,-

(අ) ඒ නියාමනය කළ අස්ථිත්වයට එම මාර්ගෝපදේශ අනුව ක්‍රියා කිරීමෙන් සිදු වූ සියලු අලාභ සහ වියදම් වෙනුවෙන් ඒ නියාමනය කළ අස්ථිත්වයට ආණ්ඩුව වන්දි ගෙවන බවට ; සහ

(ආ) ඒ නියාමනය කළ අස්ථිත්වය විසින් යම් අවශ්‍ය කටයුතුවල නිරතවීම භාර ගැනීමට පෙර ආණ්ඩුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලස්වන බවට,

කොමිෂන් සභාව වගබලා ගත යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්-

(අ) එක් එක් ලිත් වර්ෂය අවසානයේ සිට මාස තුනක් ඇතුළත, ඒ ලිත් වර්ෂයේ දී ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගත්තා ක්‍රියාමාර්ග ගෙන හැර දැක්වෙන වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) (1) වන උපවගන්තිය යටතේ පොදු ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ නිකුත් කිරීමට පූර්වයෙන්, එම ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ, පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

## VIII වන කොටස

## මුදල්

**31.** (1) කොමිෂන් සභාවට තමන්ගේම අරමුදලක් තිබිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදල.

(2) කොමිෂන් සභාවේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :-

(අ) කොමිෂන් සභාව පිහිටුවනු ලැබීමෙන් පසු පළමු වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන, මේ පනත යටතේ සහ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම සඳහා සාධාරණව අවශ්‍ය වියහැකි සියලු මුදල් ;

(ආ) කර්මාන්ත පනත් යටතේ ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් අයකරගන්නා සියලු මුදල් ;

(ඇ) මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී කොමිෂන් සභාවට ලැබෙන, ඒ පනත් යටතේ බලපත්‍ර අලුත් කිරීමේ දී ලැබෙන ගාස්තු ද ඇතුළු, සියලු මුදල් ;

(ඈ) ණය, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාවට කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු මුදල් ; සහ

(ඉ) මේ පනතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක විධිවිධාන මගින් කොමිෂන් සභාව වෙත ගෙවීමට බලය දී ඇති හෝ නියම වී ඇති සියලු මුදල්.

(3) කොමිෂන් සභාවේ අරමුදලින් පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :-

(අ) මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී කොමිෂන් සභාව දරන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක විධිවිධාන මගින් අරමුදලින් ගෙවීමට බලය දී ඇති හෝ නියම වී ඇති සියලු මුදල්.

(4) කොමිෂන් සභාවේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල්, කොමිෂන් සභාව විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතුව, සුදුසු යයි කොමිෂන් සභාව සලකන යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ද ඒ සුරැකුම්පත් පවරා දීම හෝ විකිණීම ද කරනු ලැබිය හැකි ය.

ණය ගැනීමේ බලය.

**32.** මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ කොමිෂන් සභාවේ කාර්ය හා කර්තව්‍ය කිරීම හෝ ඉටු කිරීම සඳහා සාධාරණව අවශ්‍ය වන යම් මුදල් ප්‍රමාණයක්, කොමිෂන් සභාව විසින් තාවකාලිකව අයිරා වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ණයට ලබාගත හැකි ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ යම් තාවකාලික ණය වශයෙන් ලබාගෙන තිබෙන මුදල් ප්‍රමාණවල එකතුව, කිසි අවස්ථාවක, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා, විමසා, තීරණය කරණ යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

වියදම් පිළිබඳ විධිවිධාන.

**33.** (1) යම් වර්ෂයක දී කොමිෂන් සභාවේ වියදම ඉක්මවා ඒ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ යම් ආදායම් අතිරික්තයක් වෙතොත් එය ඊළඟ වර්ෂවල වියදම් පියවා ගැනිම සඳහා ඉදිරියට ගෙන යා යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් එක් එක් වර්ෂයේ සැප්තැම්බර් මාසයට වඩා පසු නොවී ඊළඟ මුදල් වර්ෂය සඳහා එහි වැය ඇස්තමේන්තුව දැක්වෙන ප්‍රකාශයක් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

(3) යම් වර්ෂයක් සඳහා ඇස්තමේන්තු කළ වියදම් කොමිෂන් සභාව විසින් ඒ වර්ෂයේ දී ප්‍රතිශෝධනය කළ හැකි අතර එවැනි සෑම ප්‍රතිශෝධනයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

(4) යම් වර්ෂයක් සඳහා කෙමිෂන් සභාවේ වියදම, (වරින්වර සංශෝධිත පරිදි වූ) ඒ වර්ෂයේ ඇස්තමේන්තුගත වියදමෙන් සියයට දහයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉක්මවා නොයා යුතු ය.

ගිණුම් සහ විගණනය.

**34.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය. ලැබුණු ණය සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වාගත යුතු ය.

(3) විගණකාධිපතිවරයා කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(4) විගණකාධිපතිවරයාට සහ කොමිෂන් සභාවේ ගිණුම් විගණනයේ දී ඔහුට හෝ ඇයට සහාය වන යම් තැනැත්තකුට හෝ තැනැත්තියකට, ඒ විගණනයේ කාර්ය සඳහා අවශ්‍ය යයි විගණකාධිපතිවරයා සලකන සියලු පොත්පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර සහ ලේඛන පරීක්ෂා කිරීමට ඉඩ තිබිය යුතු අතර කොමිෂන් සභාව විසින් හෝ එහි නිලධරයන් විසින් ඒවා, ඒ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි, ඔවුන් දන්නා යම් තොරතුරු ද සමග සපයනු ලැබිය යුතු ය.

(5) විගණකාධිපතිවරයා කොමිෂන් සභාවේ ගිණුම් පරීක්ෂා කර-

(අ) ඔහුට හෝ ඇයට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ඔහු හෝ ඇය විසින් ලබාගන්නා ලද්දේ ද නැද්ද යන වග ප්‍රකාශ වන ;

(ආ) වාර්තාවේ සඳහන් ගිණුම්, කොමිෂන් සභාවේ කටයුතුවල සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන සේ නිසි ලෙස පිළියෙල කර තිබේ ද යන වග ප්‍රකාශ වන ; සහ

(ඇ) කොමිෂන් සභාවේ කටයුතු හා ගිණුම් පරීක්ෂා කිරීමක දී ගිණුම්වල පාර්ලිමේන්තුවේ උනන්දුව යොමු විය හැකි බව ඔහුගේ හෝ ඇයගේ මතය වන යම් විෂයයක් කෙරෙහි අවධානය යොමු කරන,

වාර්තාවක් සැපයිය යුතු ය.

(6) විගණකාධිපතිවරයා විසින් (5) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්තාව සහ ප්‍රකාශය කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

(7) කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවා ගැනීම පිණිස කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක්, කොමිෂන් සභාවේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවිය යුතු ය. මේ උපවගන්තිය යටතේ විගණකාධිපතිවරයා

වෙත ලැබෙන යම් පාරිශ්‍රමිකයක්, ඒ විගණන කාර්ය සඳහා ඔහු හෝ ඇය විසින් යොදවන ලද සුදුසුකම් ලත් යම් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ අඩුකර ගැනීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය කරුණු

**35.** (1) කොමිෂන් සභාව සහ පහත සඳහන් ආයතන එනම් :- කොමිෂන් සභාව සහ වෙනත් පුද්ගල මණ්ඩල අතර සහයෝගිතාව.

(අ) මධ්‍යම පරිසර අධිකාරිය ;

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය ;

(ඇ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ; සහ

(ඈ) මේ වගන්තියේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි වෙනත් යම් නියාමන පුද්ගල මණ්ඩලයක්,

යන එක් එක් ආයතනයේ අදාළ තැනැත්තා විසින්,-

(i) කොමිෂන් සභාව සහ ඒ එක් එක් පුද්ගල මණ්ඩලය අතර සහයෝගිතාව හා තොරතුරු හුවමාරුව ඇතිකර ගැනීම අරභයා ; සහ

(ii) කොමිෂන් සභාවේ සහ ඒ එක් එක් පුද්ගල මණ්ඩලයේ කර්තව්‍යවල විෂයපථය ඇතුළත වන කාරණවල දී, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධාන උල්ලංඝනය නොවනතාක් දුරට, එක සමාන ආකාරයකින් කටයුතු කිරීම අරභයා,

(අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් වන විට කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු මාස හයක් පසුවීමට පෙර සහ (ඈ) ඡේදයේ සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ඒ ඡේදය යටතේ ඔවුන් නම් කරනු ලැබ මාස හයක් පසු නොවීමට පෙර වැඩ පිළිවෙලක් සකස් කර ලිඛිත සංදේශයක් පිළියෙල කළ යුතු ය.

(2) ලිඛිත සංදේශයක් පිළියෙල කිරීමෙන් ඉක්බිතිව සහ එහි යම් ප්‍රතිශෝධනයක් යෝග්‍ය බවට කොමිෂන් සභාව පසුව එකඟ වන කවර හෝ අවස්ථාවක ඉන් ඉක්බිතිව, ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින්, (1) වන උපවගන්තියේ සඳහන් එක් එක් පුද්ගල මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ ලිඛිත සංදේශයේ හෝ ප්‍රතිශෝධිත සංදේශයේ පිටපතක්, අමාත්‍යවරයාගේ දැනගැනීම පිණිස, ඔහු හෝ ඇය වෙත කොමිෂන් සභාව විසින් යවනු ලැබිය යුතු ය.

(3) පහත සඳහන් එක් එක් පුද්ගල මණ්ඩලය වෙනුවෙන් "අදාළ තැනැත්තා"—

(අ) මධ්‍යම පරිසර අධිකාරිය සම්බන්ධව වන විට එහි සාමාන්‍යාධිකාරිවරයා විය යුතු ය ;

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධව වන විට, එහි සාමාන්‍යාධිකාරිවරයා විය යුතු ය ;

(ඇ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධයෙන් වන විට එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය: සහ

(ඈ) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ නම් කරන ලද පුද්ගල මණ්ඩලයක් සම්බන්ධව වන විට, එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

36. (1) (අ) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවක් සම්බන්ධයෙන්, කොමිෂන් සභාවට විරුද්ධව ;

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු (ඇත්නම්), කාර්ය මණ්ඩලය, උපදේශකයකු හෝ උපදෙස් දෙන්නකු විසින් මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව කවර හෝ අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද වියදම්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් අයකර ගන්නා ලද ගාස්තු කිසිවක් ඇත්නම් ඒ ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, එහි ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු (ඇත්නම්), කාර්ය මණ්ඩලය, උපදේශකයකු හෝ උපදෙස් දෙන්නකු විසින් මේ පනත යටතේ හෝ වෙනත් යම් කර්මාන්ත පනතක් යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය පිට කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත ක්‍රියාවක් සම්බන්ධයෙන් කවර හෝ අධිකරණයක ඔහුට හෝ ඇයට විරුද්ධව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළහොත්, ඒ නඩුවේ දී ඔහු හෝ ඇය විසින් දරන ලද වියදම් ඔහු විසින් අයකරගනු ලැබුවහොත් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

**37.** (1) කොමිෂන් සභාව විසින් එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් මාස තුනක් ඇතුළත, ඒ ඒ වර්ෂයේ කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳව සහ ඊළඟ වර්ෂය සඳහා, යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් පිළියෙල කොට, කොමිෂන් සභාවේ විගණනය කළ ගිණුම් වාර්තාවේ පිටපතක් ද සමග එය අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව ලැබුණුවිට අමාත්‍යවරයා විසින් –

(අ) ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව හමුවේ තැබීමට සැලැස්විය යුතු ය :

(ආ) ඒ වාර්තාවෙන් උද්ගත වන යම් කාරණා පාර්ලිමේන්තුවට හෝ පාර්ලිමේන්තුවේ කමිටුවකට පැහැදිලි කරන ලෙස කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටිය හැකි ය ;

(ඇ) ඒ වාර්තාව සහ ගිණුම්, මහජන අවධානයට පාත්‍රවීම සඳහා යෝග්‍ය යයි ඔහු හෝ ඇය සලකන යම් ආකාරයකින් පළ කරන ලෙස කොමිෂන් සභාවට නියම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, සෑම වාර්ෂික වාර්තාවකම –

(අ) ඒ වාර්තාව අදාළ වාර්ෂය ඇතුළත උද්ගත වූ කොමිෂන් සභාවේ කර්තව්‍යවල විෂය පථය ඇතුළත වන කාරණා පිළිබඳව, විශේෂයෙන් පාරිභෝගික සම්බන්ධතා ප්‍රවර්ධනයෙහි ලා උද්ගත වූ කාරණා පිළිබඳව පොදු සමීක්ෂණයක් ඇතුළත් විය යුතු ය ;

(ආ) ඒ වර්ෂය ඇතුළත කොමිෂන් සභාව විසින් කරන ලද බලාත්මක කිරීමේ නියමයක් (ඇත්නම්) පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි මහජන උපයෝගිතා කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය.

රීති සෑදීමට කොමිෂන් සභාවට බලය ඇති බව.

**38.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියමිත සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

වෙනත් ලිඛිත නීති සමග සට්ටන පිළිබඳ විධිවිධාන.

**39.** මේ පනත නොවන යම් අදාළ පනතක මේ පනතේ විධිවිධානවලට අනනුකූල කවර විධිවිධානයක් අන්තර්ගතව තිබුණ ද, මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන නියෝග, රීති හෝ නියමයක් බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් අදාළ පනතක විධිවිධාන අතර කවර සට්ටනයක් තිබුණ ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**40.** යම් අනපේක්ෂිත හෝ විශේෂ අවස්ථාගත කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස හෝ මේ පනතින් විධිවිධාන හෝ සාර්ථක විධිවිධාන සලසා නොමැති යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් විසඳීම හෝ ඊට අවශ්‍ය ගැලපීම් කිරීම පිණිස, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් සලස්වනු ලැබිය හැකි ය.

විධිවිධාන සලසා නොමැති ප්‍රශ්න සඳහා ගැලපීම්.

**41.** කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

**42.** කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව අර්ථකථනය කළ යුතු ය.

අල්ලස් පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**43.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**44.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතෙහි–

අර්ථ නිරූපණය.

"පනත" යන්නෙන්, පාර්ලිමේන්තු පනතක් අදහස් වේ ;

"වාර්ෂික වාර්තාව" යන්නෙන්, 37 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව අදහස් වේ ;

"මධ්‍යම පරිසර අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පරිසර අධිකාරිය පනත අදහස් වේ ;

"සභාපති" යන්නට, 8(6) වගන්තිය යටතේ පත් කරන ලද නියෝජ්‍ය සභාපතිවරයා ද ඇතුළත් වේ ;

"සම්බන්ධිත තැනැත්තා" යන්න, යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ තැනැත්තාගේ කලත්‍රයා, දරුවකු, සහෝදරයකු හෝ සහෝදරියක් අදහස් වේ ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අදහස් වේ ;

"පාරිභෝගිකයා" යන්නෙන්, ප්‍රතිෂ්ඨාව ගෙවා හෝ ගෙවීමේ පොරොන්දුව මත, හෝ කොටසක් ගෙවා සහ කොටසක් ගෙවීමේ පොරොන්දුව මත හෝ, කිසියම් විලම්බනය කළ ගෙවීම් ක්‍රමයක් යටතේ යම් භාණ්ඩ හෝ සේවා මිල දී ගන්නා හෝ ලබා ගන්නා තැනැත්තා අදහස් වන අතර, එයට–

(i) ප්‍රතිෂ්ඨාව ගෙවා හෝ ගෙවීමේ පොරොන්දුව මත හෝ යම් විලම්බනය කළ ගෙවීමේ ක්‍රමයක් යටතේ ඒ භාණ්ඩ හෝ සේවා මිල දී ගන්නා තැනැත්තා නොවන, ඒ භාණ්ඩ ප්‍රයෝජනයට ගැනිම හෝ සේවාවල ප්‍රතිලාභ ලැබීම, පළමු කී තැනැත්තාගේ අනුමතිය ඇතිව සිදු කෙරෙන විටක, එසේ එම භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා හෝ සේවාවල ප්‍රතිලාභ ලබන්නා ද ;

(ii) ඒ භාණ්ඩ අනාගතයේ මිල දී ගැනිමට හෝ අනාගතයේ ඒ සේවාවල ප්‍රතිලාභ ලැබීමට ඉඩ ඇති තැනැත්තකු ද,

ඇතුළත් වේ ;

"මුදල් වර්ෂය" යන්නෙන්, ලිත් වර්ෂය අදහස් වේ ;

"කර්මාන්ත පනත" යන්නෙන්, නියාමනය කිරීම කොමිෂන් සභාව වෙත පනු වී ඇති හෝ පැවරී ඇති, යම් නිශ්චිත මහජන උපයෝගිතා කර්මාන්තයක් පාලනය වන පනත අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ප්‍රතිපත්ති සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"දැන්වීම" යන්නෙන්, ලියවිල්ලකින් වූ දැන්වීමක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා හෝ කොමිෂන් සභාව විසින් නියමිත යන්න අදහස් වේ ;

"නියමිත ප්‍රතිශතය" යන්න, උපයෝගිතා ජාලයක හෝ උපයෝගිතා සේවාවකට අදාළව යෙදෙන විට දී සියයට හතලිහ හෝ වාණිජ විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග මගින් ප්‍රතිශතයක් නියම කර ඇත්නම් ඒ ප්‍රතිශතය යන මෙයින් වඩා ඉහළ ප්‍රතිශතය අදහස් වේ ;

"මහජන උපයෝගිතා කර්මාන්තය" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා නියාමනය කිරීම කොමිෂන් සභාව වෙත සතු වී ඇති හෝ පැවරී ඇති යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් අදහස් වේ ;

"නියාමනය කළ අස්ථිත්වය" යන්නෙන්, කොමිෂන් සභාව විසින් දෙන ලද වලංගු බලපත්‍රයක්, නිදහස් කිරීමක්, අනුග්‍රහයක් හෝ කොන්ත්‍රාත්තුවක් යටතේ මහජන උපයෝගිතා සේවාවක්, යම් කර්මාන්ත පනතක විධිවිධානවලට යටත්ව සැපයීමෙහි නිරත සමාගමක් හෝ ව්‍යාපාරයක් අදහස් වේ ;

"අදාළ පනත" යන්නෙන්, 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂක පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ [illegible] හා පනත සහ (173 වන අධිකාරය වූ) [illegible] නත හෝ ඒ කිසිවක් වෙනුවට ප්‍රතියෝජනය කරන [illegible] ාක් හෝ මහජන උපයෝගිතා කර්මාන්ත නොවන කර්මාන්ත සඳහා තරඟකාරිත්වය පිළිබඳව මේ සමාන විධිවිධාන අන්තර්ගත වෙනත් යම් පනතක් අදහස් වේ ;

"විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 1991 අංක 21 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පනතින් පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ ;

"අසාධාරණ වෙළෙඳ ක්‍රියාව" යන්නෙන්, යම් භාණ්ඩ විකිණීම, පාවිච්චිය හෝ සැපයීම හෝ යම් සේවා සැපයීම ප්‍රවර්ධනය සඳහා, මෙහි පහත සඳහන් වන යම් පරිචයන් එනම් :-

(1) (අ) එම භාණ්ඩ කිසියම් විශේෂිත ප්‍රමිතියක්, ගුණාත්මක භාවයක්, ප්‍රමාණයක්, ශ්‍රේණියක්, සංයුතියක්, ශෛලියක් හෝ මෝස්තරයක් දරන බව සාවද්‍ය ලෙස නිරූපණය කරන ;

(ආ) එම සේවා කිසියම් විශේෂිත ප්‍රමිතියක, තත්ත්වයක හෝ ශ්‍රේණියක වන බව සාවද්‍ය ලෙස නිරූපණය කරන ;

(ඇ) යම් භාණ්ඩ හෝ සේවා අවශ්‍යතාවය පිළිබඳව සාවද්‍ය හෝ නොමග යවන සුළු නිරූපණයක් කරන ;

(ඈ) වෙනත් යම් තැනැත්තකුගේ භාණ්ඩ, සේවා හෝ ව්‍යාපාරය නිග්‍රහයට ලක් කරන සාවද්‍ය හෝ නොමග යවන සුළු කරුණු ඉදිරිපත් කරන ; සහ

(2) යම් කර්මාන්ත පනතකින් හෝ ඒ පනතක් යටතේ සාදන ලද නියෝග මගින්, කාර්ය සාධනය, සංයුතිය, අන්තර්ගත දේ, මෝස්තරය, නිර්මාණය, නිමාව හෝ ඇසුරුම සම්බන්ධ නියමිතව තිබෙන, අදාළ භාණ්ඩ පාවිච්චියට ගන්නා තැනැත්තකුට හානියක් වීම වැළැක්වීම හෝ හානියක් වීමේ අවදානම අඩුකිරීම සඳහා අවශ්‍ය නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන බව දැන දැනම හෝ විශ්වාස කිරීමට හේතු තිබිය දී, පාරිභෝගිකයන් විසින් පාවිච්චි කරනු ලැබීම අරමුණු කර හෝ පාවිච්චි කරනු ලැබීමට ඉඩ තිබෙන වර්ගයක භාණ්ඩ විකිණීමට හෝ සැපයීමට ඉඩ දෙන,

ප්‍රකාශයක්, වාචිකව හෝ ලියවිල්ලක් මගින් හෝ යම් දෘශ්‍ය නිරූපණයක් මගින් හෝ කිරීම ඇතුළුව, යම් අසාධාරණ ක්‍රමයක් හෝ යම් අසාධාරණ නැතහොත් වංචනිය පරිචයක් උපයෝගී කර ගැනීම අදහස් වේ ;

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

## උපලේඛනය

[1(2) වන වගන්තිය]

1. විදුලිබල කර්මාන්තය ; සහ

2. ජල සේවා කර්මාන්තය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.